# 1. 5 4.

# චූළවෙදල්ල සුත්තං

එවං මෙ සුතං: එකං සමයං භගවා **රජගහෙ** විහරති වෙළුවනෙ **කලන්දකනිවාපෙ**. අථ ඛො **විසාඛො** උපාසකො යෙන **ධම්මදින්නා** භික්ඛුනී තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ධම්මදින්නං භික්ඛුනිං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො විසාඛො උපාසකො ධම්මදින්නං භික්ඛුනිං එතදවොච:

1. සක්කායො සක්කායොති අය්‍යෙ වුච්චති. කතමො නු ඛො අය්‍යෙ සක්කායො වුත්තො භගවතාති?

පඤ්ච ඛො ඉමෙ ආවුසො විසාඛ උපාදානක්ඛන්ධා සක්කායො වුත්තො භගවතා. සෙය්‍යථීදං: රූපූපාදානක්ඛන්ධො වෙදනුපාදානක්ඛන්ධො සඤ්ඤුපාදානක්ඛන්ධො සඞ්ඛාරූපාදානක්ඛන්ධො විඤ්ඤාණූපාදානක්ඛන්ධො. ඉමෙ ඛො ආවුසො විසාඛ පඤ්චුපාදානක්ඛන්ධා සක්කායො වුත්තො භගවතාති.

2. සාධු අය්‍යෙති ඛො විසාඛො උපාසකො ධම්මදින්නාය භික්ඛුනියා භාසිතං අභිනන්දිත්වා අනුමොදිත්වා ධම්මදින්නං භික්ඛුනිං උත්තරිං පඤ්හං ආපුච්ඡි: සක්කායසමුදයො සක්කායසමුදයොති අය්‍යෙ වුච්චති. කතමො නු ඛො අය්‍යෙ සක්කායසමුදයො වුත්තො භගවතාති?

යායං ආවුසො විසාඛ තණ්හා පොනොභවිකා නන්දිරාගසහගතා තත්‍ර තත්‍රාභිනන්දිනී, සෙය්‍යථීදං: කාමතණ්හා භවතණ්හා විභවතණ්හා. අයං ඛො ආවුසො විසාඛ සක්කායසමුදයො වුත්තො භගවතාති.

3. සක්කායනිරොධො සක්කායනිරොධොති අය්‍යෙ වුච්චති. කතමො නු ඛො අය්‍යෙ සක්කායනිරොධො වුත්තො භගවතාති?

යො ඛො ආවුසො විසාඛ තස්සායෙව තණ්හාය අසෙසවිරාගනිරොධො චාගො පටිනිස්සග්ගො මුත්ති අනාලයො, අයං ඛො ආවුසො විසාඛ සක්කායනිරොධො වුත්තො භගවතාති

4. සක්කායනිරොධගාමිනී පටිපදා සක්කායනිරොධගාමිනීපටිපදාති අය්‍යෙ වුච්චති. කතමා නු ඛො අය්‍යෙ සක්කායනිරොධගාමිනිපටිපදා වුත්තා භගවතාති?

# 1. 5. 4.

# චූළවෙදල්ල සූත්‍රය

මා විසින් මෙසේ අසන ලදී: එක් සමයෙක භාග්‍යවතුන් වහන්සේ රජගහ නුවර (ලෙහෙනුනට නිම දුනුයෙන්) කලන්දකනිවාප නම් වූ වෙළුවනයෙහි වැඩවසන සේක. එසමයෙහි විසාඛ උවසු ධම්මදින්නා මෙහෙණ කරා එළඹිණ. එළඹ ධම්මදින්නා මෙහෙණ ඇදුරු කොට වැඳ එකත්පසෙක හින. එකත්පස් ව හුන් විසාඛ උපාසක ධම්මදින්නා මෙහෙණට (සක්කායො-ආදි) තෙලබස් කී:

1. ආයසීංවෙනි, 'සත්කාය, සත්කාය' යි කියනු ලැබේ. භාග්‍යවතුන් වහන්සේ විසින් කවර දහමෙක් 'සත්කාය' යි වදාරන ලද්දේ ද?

ඇවැත විසාඛයෙනි, භාග්‍යවතුන් වහන්සේ විසින් මේ උපාදානයනට ප්‍රත්‍යය වූ සකන්ධ පස 'සත්කාය'යි වදාරන ලද්දේය. හෙ කෙසේය යත්: රූපොපාදානසකන්ධය, වේදනොපාදානසකන්ධය, සංඥෛපාදානසකන්ධය, සංසකාරොපාදානසකන්ධය, විඥනොපාදනසකන්ධයි. ඇවැත විසාඛයෙනි, භාග්‍යවතුන් වහන්සේ විසින් මේ පඤ්චොපාදානසකන්ධ 'සත්කාය' යි වදාරන ලදී.

2. විසාඛ උපාසක 'ආයසීංවෙනි, බුණුසේ මැනැවැ'යි ධම්මදින්නා මෙහෙණගේ බසට තුටු ව, අනුමෝදන් ව ධම්මදින්නා මෙහෙණ මතුයෙහි (ආපුච්ඡා විසින්) පැන පිළිවිත්: ආයසීංවෙනි, 'සත්කාය සමුදය, සත්කාය සමුදය' යි කියනු ලැබේ. ආයසීංවෙනි, භාග්‍යවතුන් වහන්සේ විසින් කිනම් දහමෙක් 'සත්කාය සමුදය'යි වදාරන ලද්දේ ද?

ඇවැත විශාඛයෙනි, පුනර්භවය පිණිස වැටෙන, නන්දිරාගසහගත, ඒ ඒ භවයෙහි ඇලුම් කරන යම් මේ තෘෂ්ණා ඇද්ද, ඕ කවර යත්: කාම තෘෂ්ණාය, භවතෘෂ්ණාය, විභවතෘෂ්ණායි. ඇවැත විශාඛයෙනි, භාග්‍යවතුන් වහන්සේ විසින් මේ තෘෂ්ණා 'සත්කාය සමුදය' විසින් වදාරන ලදූ.

3. ආයසීංවෙනි, 'සත්කායනිරොධය සත්කායනිරොධය'යි කියනු ලැබේ. ආයසීංවෙනි, භාග්‍යවතුන් වහන්සේ විසින් කිනම් දහමෙක් 'සත්කාර නිරොධය'යි වදාරන ලද්දේ ද?

ඇවැත, විශාඛයෙනි, එම තෘෂ්ණාවගේ යම් අශෙෂවිරාගනිරොධයෙක් ත්‍යාගයෙක් ප්‍රතිනිස්සග්ගයෙක් විමුක්තියෙක් අනාලයෙක් ඇද්ද, ඇවැත විශාඛයෙනි, තෘෂ්ණාවගේ මේ අශෙෂවිරාගනිරොධය 'සත්කාය නිරොධය' යි භාග්‍යවතුන්වහන්සේ විසින් වදාරන ලදී

4. ආයසීංවෙනි, සත්කායනිරොධගාමිනී ප්‍රතිපදාය, සත්කායනිරොධ-ගාමිනීප්‍රතිපදාය'යි කියනු ලැබේ. ආයසීංවෙනි, භාග්‍යවතුන් වහන්සේ විසින් කිනම් ප්‍රතිපදා 'සත්කායනිරොධගාමිනීප්‍රතිපදාය'යි වදාරන ලදූ ද?

අයමෙව ඛො ආවුසො විසාඛ අරියො අට්ඨඞ්ගිකො මග්ගො සක්කායනිරොධගාමිනීපටිපදා වුත්තා භගවතා සෙය්‍යථීදං: සම්මාදිට්ඨි සම්මාසඞ්කප්පො සම්මාවාචා සම්මාකම්මන්තො සම්මාආජීවො සම්මාවායාමො සම්මාසති සම්මාසමාධීති.

5. තඤ්ඤෙව නු ඛො අය්‍යෙ උපාදානං තෙව පඤ්චුපාදානක්ඛන්ධා, උදාහු අඤ්ඤං නු ඛො පඤ්චහුපාදානක්ඛන්ධෙහි උපාදානන්ති?

න ඛො ආවුසො විසාඛ තඤ්ඤෙව උපාදානං, තෙව පඤ්චුපාදානක්ඛන්ධා, නපි අඤ්ඤත්‍ර පඤ්චහුපාදානක්ඛන්ධෙහි උපාදානං. යො ඛො ආවුසො විසාඛ පඤ්චසුපාදානක්ඛන්ධෙසු ඡන්දරාගො, තං තත්‍ථ උපාදානන්ති.

6. කථං පනය්‍යෙ සක්කායදිට්ඨි හොතීති?

ඉධාවුසො විසාඛ අස්සුතවා පුථුජ්ජනො අරියානං අදස්සාවී අරියධම්මස්ස අකොවිදො අරියධම්මෙ අවිනීතො, සප්පුරිසානං අදස්සාවී සප්පුරිසධම්මස්ස අකොවිදො සප්පුරිසධම්මෙ අවිනීතො රූපං අත්තතො සමනුපස්සති, රූපවන්තං වා අත්තානං, අත්තනි වා රූපං, රූපස්මිං වා අත්තානං. වෙදනං අත්තතො සමනුපස්සති, වෙදනාවන්තං වා අත්තානං, අත්තනි වා වෙදනං, වෙදනාය වා අත්තානං. සඤ්ඤං අත්තතො සමනුපස්සති, සඤ්ඤාවන්තං වා අත්තානං, අත්තනි වා සඤ්ඤං, සඤ්ඤාය වා අත්තානං. සංඛාරෙ අත්තතො සමනුපස්සති, සංඛාරවන්තං වා අත්තානං, අත්තනි වා සංඛාරෙ, සඞ්ඛාරෙසු වා අත්තානං විඤ්ඤාණං අත්තතො සමනුපස්සති, විඤ්ඤාණවන්තං වා අත්තානං, අත්තනි වා විඤ්ඤාණං, විඤ්ඤාණස්මිං වා අත්තානං. එවං ඛො ආවුසො විසාඛ සක්කායදිට්ඨි හොතීති.

7. කථං පනය්‍යෙ සක්කායදිට්ඨි න හොතීති?

ඉධාවුසො විසාඛ සුතවා අරියසාවකො අරියානං දස්සාවී අරියධම්මස්ස කොවිදො අරියධම්මෙ සුවිනීතො, සප්පුරිසානං දස්සාවී සප්පුරිසධම්මස්ස කොවිදො සප්පුරිසධම්මෙ සුවිනීතො න රූපං අත්තතො සමනුපස්සති, න රූපවන්තං වා අත්තානං, න අත්තනි වා රූපං, න රූපස්මිං වා අත්තානං. න වෙදනං අත්තතො සමනුපස්සති, න වෙදනාවන්තං වා අත්තානං, න අත්තනි වා වෙදනං, න වෙදනාය වා අත්තානං. න සඤ්ඤං අත්තතො සමනුපස්සති, න සඤ්ඤාවන්තං වා අත්තානං, න අත්තනි වා සඤ්ඤං, න සඤ්ඤාය වා අත්තානං. න සංඛාරෙ අත්තතො සමනුපස්සති, න සංඛාරවන්තං වා අත්තානං, න අත්තනි වා සංඛාරෙ, න සංඛාරෙසු වා අත්තානං. න විඤ්ඤාණං අත්තතො සමනුපස්සති, න විඤ්ඤාණවන්තං වා අත්තානං, න අත්තනි වා විඤ්ඤාණං, න විඤ්ඤාණස්මිං වා අත්තානං. එවං ඛො ආවුසො විසාඛ සක්කායදිට්ඨි න හොතීති.

1/8/2021 1.5.4 චූළවේදල්ල සූත්‍රය



ඇවැත, විශාඛයෙනි, භාග්‍යවතුන් වහන්සේ විසින් මේ අරීඅටඟිමග ම 'සත්කායනිරොධගාමිනීප්‍රතිපදා'යයි වදාරනලදී. හෙ කෙසේය යත්: සම්‍යග් දෘෂ්ටිය, සම්‍යක්සංකල්පය, සම්‍යග්වාචාය, සම්‍යක්කර්මාන්තය, සම්‍යගාජීවය, සම්‍යග් ව්‍යායාමය, සම්‍යක්ස්මෘතිය, සම්‍යක්සමාධියයි.

5. ආර්යාවෙනි, ඒ උපාදාන හා ඒ පඤ්චොපාදානස්කන්ධ හා එක් ම වේ ද? නොහොත් පඤ්චොපාදානස්කන්ධ පියා උපාදාන අනෙකෙක් වේ ද?

ඇවැත විශාඛයෙනි, ඒ උපාදාන හා ඒ පඤ්චොපාදානස්කන්ධ හා එකෙක් ම නොවේ. පඤ්චොපාදානස්කන්ධ පියා උපාදාන නො ද අනෙකෙක් වෙයි. ඇවැත විශාඛයෙනි, පඤ්චොපාදානස්කන්ධ කෙරෙහි යම් ඡන්දරාගයෙක් ඇද්ද, ඒ එහි උපාදාන නම් වෙයි.

6. ආර්යාවෙනි, කෙසේ නම් සත්කායදෘෂ්ටි ඇති වේ ද?

ඇවැත විශාඛයෙනි, මේ ලොව ආර්යයන් නොදක්නා සුළු, ආර්යධර්මය පිළිබඳ අකොවිද, ආර්යධර්මයෙහි අවිනීත, (බුද්ධාදි) සත්පුරුෂයන් නොදක්නාසුළු, සත්පුරුෂධර්මය පිළිබඳ අකොවිද, සත්පුරුෂධර්මයෙහි අවිනීත අශ්‍රැතවත් පෘථග්ජන ශුද්ධරූපය ආත්මවශයෙන් (අද්වය කොට) දක්නේ ය. අරූප ආත්මයා රූපවත් කොට හෝ, රූපය ආත්මයා කෙරෙහි එළවා හෝ, ආත්මයා රූපයා කෙරෙහි එළවා හෝ (දෘෂ්ටිදර්ශනයෙන්) දක්නේය. වේදනා ආත්ම වශයෙන් දක්නේය. ආත්මයා වේදනාවත් කොට හෝ, වේදනා ආත්මයා කෙරෙහි එළවා හෝ, ආත්මයා වේදනා කෙරෙහි එළවා හෝ දක්නේය. සංඥා ආත්මවශයෙන් දක්නේ ය. ආත්මයා සංඥාවත් කොට හෝ, සංඥා ආත්මයා කෙරෙහි එළවා හෝ, ආත්මයා සංඥා කෙරෙහි එළවා හෝ දක්නේ ය. සංසකාරයන් ආත්මවශයෙන් දක්නේ ය. ආත්මයා සංසකාරවත් කොට හෝ, සංසකාර ආත්මයා කෙරෙහි එළවා හෝ, ආත්මයා සංසකාර කෙරෙහි එළවා හෝ දක්නේ ය. විඥාන ආත්ම වශයෙන් දක්නේ ය. ආත්මයා විඥානවත් කොට හෝ, විඥාන ආත්මයා කෙරෙහි එළවා හෝ, ආත්මයා විඥාන කෙරෙහි එළවා හෝ දක්නේ ය. ඇවැත විශාඛයෙනි, මෙසෙයින් සත්කාය දෘෂ්ටි ඇති වෙතියි කියූ.

7. ආර්යාවෙනි, කෙසේ නම් සත්කායදෘෂ්ටි නොවේ ද?

ඇවැත, විශාඛයෙනි, මෙලොව ආර්යයන් දක්නා සුළු, ආර්යධර්මය පිළිබඳව කොවිද, ආර්යධර්මයෙහි සුවිනීත, සත්පුරුෂයන් දක්නාසුළු, සත්පුරුෂධර්මය පිළිබඳ ව කොවිද, සත්පුරුෂධර්මයෙහි සුවිනීත ශ්‍රැතවත් ආර්යශ්‍රාවක රූපය ආත්ම වශයෙන් නො දක්නේ ය. ආත්මයා රූපවත් කොට හෝ, රූපය ආත්මයෙහි පිහිටියේය යි හෝ, ආත්මය රූපයෙහි පිහිටියේය යි හෝ, නො දක්නේය. වේදනා ආත්ම වශයෙන් නො දක්නේ ය. ආත්මයා වේදනාවත් කොට හෝ, වේදනා ආත්මයෙහි පිහිටියේ ය යි හෝ, ආත්මය වේදනායෙහි පිහිටියේය යි හෝ නොදක්නේ ය. සංඥා ආත්ම වශයෙන් නො දක්නේ ය. ආත්මයා සංඥාවත් කොට හෝ සංඥා ආත්මයෙහි පිහිටිය යි හෝ, ආත්මය සංඥායෙහි පිහිටියේය යි හෝ, නො දක්නේය. සසකාර ආත්ම විසින් නො දක්නේය. ආත්මය සංසකාරවත් කොම හෝ, සංසකාර ආත්මයෙහි පිහිටියේ ය යි හෝ, ආත්මය සංසකාරයෙහි පිහිටියේ ය යි හෝ නො දක්නේ ය. විඥාන ආත්මවශයෙන් නො දක්නේ ය. ආත්මය විඥානවත් කොට හෝ, විඥානය ආත්මයෙහි පිහිටියේ ය යි හෝ, ආත්මය විඥානයෙහි පිහිටියේ ය යි හෝ නො දක්නේ ය. ඇවැත විශාඛයෙනි, මෙසෙයින් සත්කායදෘෂ්ටි නොවෙතියි කියූ.



https://www.thripitakaya.org/bjt/index/143 4/12

8. කතමො පනය්‍යෙ අරියො අට්ඨඞ්ගිකො මග්ගොති?

අයමෙව ඛො ආවුසො විසාඛ අරියො අට්ඨඞ්ගිකො මග්ගො, සෙය්‍යථීදං: සම්මාදිට්ඨි සම්මාසඞ්කප්පො සම්මාවාචා සම්මාකම්මන්තො සම්මා ආජීවො සම්මාවායාමො සම්මාසති සම්මාසමාධීති.

9. අරියො පනය්‍යෙ අට්ඨඞ්ගිකො මග්ගො සඞ්ඛතො උදාහු අසඞ්ඛතොති?

අරියො ඛො ආවුසො විසාඛ අට්ඨඞ්ගිකො මග්ගො සඞ්ඛතොති.

10. අරියෙන නු ඛො අය්‍යෙ අට්ඨඞ්ගිකෙන මග්ගෙන තයො ඛන්ධා සඞ්ගහිතා, උදාහු තීහි ඛන්ධෙහි අරියො අට්ඨඞ්ගිකො මග්ගො සඞ්ගහීතොති?

න ඛො ආවුසො විසාඛ අරියෙන අට්ඨඞ්ගිකෙන මග්ගෙන තයො ඛන්ධා සඞ්ගහිතා. තීහි ච ඛො ආවුසො විසාඛ ඛන්ධෙහි අරියො අට්ඨඞ්ගිකො මග්ගො සඞ්ගහීතො: යා චාවුසො විසාඛ සම්මාවාචා යො ච සම්මාකම්මන්තො යො ච සම්මාආජීවො, ඉමෙ ධම්මා සීලක්ඛන්ධෙ සඞ්ගහිතා. යො ච සම්මාවායාමො යා ච සම්මාසති යො ච සම්මාසමාධි, ඉමෙ ධම්මා සමාධික්ඛන්ධෙ සඞ්ගහිතා. යා ච සම්මාදිට්ඨි යො ච සම්මාසඞ්කප්පො, ඉමෙ ධම්මා පඤ්ඤාක්ඛන්ධෙ සඞ්ගහිතාති.

11. කතමො පනය්‍යෙ සමාධි, කතමෙ සමාධිනිමිත්තා, කතමෙ සමාධිපරික්ඛාරා, කතමා සමාධිභාවනාති?

යා ඛො ආවුසො විසාඛ චිත්තස්ස එකග්ගතා අයං සමාධි. චත්තාරො සතිපට්ඨානා සමාධිනිමිත්තා. චත්තාරො සම්මප්පධානා සමාධිපරික්ඛාරා. යා තෙසංයෙව ධම්මානං ආසෙවනා භාවනා බහුලීකම්මං, අයං තත්ථ සමාධිභාවනාති.

12. කති පනය්‍යෙ සඞ්ඛාරාති?

තයොමෙ ආවුසො විසාඛ සඞ්ඛාරා: කායසඞ්ඛාරො වචීසඞ්ඛාරො චිත්තසඞ්ඛාරොති.

13. කතමො පනය්‍යෙ කායසඞ්ඛාරො, කතමො වචීසඞ්ඛාරො, කතමො චිත්තසඞ්ඛාරොති?

අස්සාසපස්සාසා ඛො ආවුසො විසාඛ කායසඞ්ඛාරො. විතක්කවිචාරා වචීසඞ්ඛාරො. සඤ්ඤා ච වෙදනා ච චිත්තසඞ්ඛාරොති.

8. ආයුෂ්මතියෙනි, අරිඅටඟිමග කවරේ ද?

ඇවැත විශාඛයෙනි, මේ ම අරිඅටඟිමග වෙයි. හෙ කෙසෙය යත්: සම්‍යග්දෘෂ්ටිය, සම්‍යක්සඞ්කල්පය, සම්‍යග්වාචාය, සම්‍යක්කර්මාන්තය, සම්‍යගාජීවය, සම්‍යග්ව්‍යායාමය, සම්‍යක්ස්මෘතිය, සම්‍යක්සමාධියි.

9. ආයුෂ්මතියෙනි, අරිඅටඟිමග කිසිප්‍රත්‍යයෙකින් කරන ලද වේ ද?

ඇවැත විශාඛයෙනි, අරිඅටඟිමග කිසි ප්‍රත්‍යයෙකින් කරන ලද වෙයි.

10 ආයුෂ්මතියෙනි, ආයුෂ්අෂ්ටාඞ්ගිකමාර්ගය විසින් ත්‍රිවිධස්කන්ධයෝ සංග්‍රහ කොට ගන්නා ලද්දාහු ද? නොහොත් ත්‍රිවිධස්කන්ධයන් විසින් ආයුෂ්-අෂ්ටාඞ්ගිකමාර්ගය සංග්‍රහ කොට ගන්නා ලද්දේ ද?

ඇවැත විශාඛයෙනි, ආයුෂ්ටාඞ්ගිකමාර්ගය විසින් ත්‍රිවිධස්කන්ධයෝ සඞ්ගෘහීත නොවෙති. ඇවැත විශාඛයෙනි, ත්‍රිවිධස්කන්ධ විසින් ආයුෂ්ටා-ඞ්ගිකමාර්ගය සඞ්ගෘහීත වෙයි. ඇවැත විශාඛයෙනි, යම් සම්‍යග්වාචායෙක් ඇද්ද, යම් සම්‍යක් කර්මාන්තයෙක් ඇද්ද, යම් සම්‍යගාජීවයෙක් ඇද්ද, මේ දහම්හු ශීලස්කන්ධය විසින් සඞ්ගෘහීත වෙති. යම් සම්‍යග්ව්‍යායාමයෙක් ඇද්ද, යම් සම්‍යක් ස්මෘතියෙක් ඇද්ද, යම් සම්‍යක්සමාධියෙක් ඇද්ද, මේ දහම්හු සමාධිස්කන්ධය විසින් සඞ්ගෘහීත වෙති. යම් සම්‍යග්දෘෂ්ටියෙක් ඇද්ද, යම් සම්‍යක්සඞ්කල්පයෙක් ඇද්ද, මේ දහම්හු ප්‍රඥාස්කන්ධය විසින් සඞ්ගෘහීත වෙතියි කීහු.

11. ආයුෂ්මතියෙනි, සමාධි කවරේ ද? සමාධිනිමිත්තයෝ කවරහු ද? සමාධිපරිෂ්කාරයෝ කවරහු ද? සමාධිභාවනා කවර?

ඇවැත විශාඛයෙනි, යම් චිත්තෙකාග්‍රතායෙක් ඇද්ද, මේ ද සමාධි-නම්. සතරසිවටන්හු සමාධිනිමිති වෙති. සතර සම්‍යක්ප්‍රධන්වීර්යයෝ සමාධිපරිෂ්කාර වෙති. එම දහමුන් පිළිබඳ යම් ආසෙවනායෙක් භාවනා-යෙක් බහුලීකමෙක් ඇද්ද, මේය එහි සමාධි භාවනා නම්.

12. ආයුෂ්මතියෙනි, සංස්කාරයෝ කෙතෙක් ඇද්ද?

ඇවැත විශාඛයෙනි, සංස්කාරයෝ මොහු තුන් දෙනෙකි. කායසංස්කා-රය, වාක්සංස්කාරය, චිත්තසංස්කාරයි.

13. ආයුෂ්මතියෙනි, කායසංස්කාර කවරේ ද? වාක්සංස්කාර කවරේ ද? චිත්තසංස්කාර කවරේ ද?

ඇවත විශාඛයෙනි, ආශ්වාසප්‍රශ්වාස කායසංස්කාර යි. විතර්කවිචාර වාක්සංස්කාර යි. සංඥා හා වෙදනා චිත්තසංස්කාර යි.

14. කස්මා පනාය්‍යෙ අස්සාසපස්සාසා කායසඞ්ඛාරො? කස්මා විතක්කවිචාරා වචීසඞ්ඛාරො, කස්මා සඤ්ඤා ච වෙදනා ච චිත්තසඞ්ඛාරොති?

අස්සාසපස්සාසා ඛො ආවුසො විසාඛ කායිකා එතෙ ධම්මා කායපටිබද්ධා. තස්මා අස්සාසපස්සාසා කායසඞ්ඛාරො. පුබ්බෙ ඛො ආවුසො විසාඛ විතක්කෙත්වා විචාරෙත්වා පච්ඡා වාචං භින්දති. තස්මා විතක්කවිචාරා වචීසඞ්ඛාරො. සඤ්ඤා ච වෙදනා ච චෙතසිකා එතෙ ධම්මා චිත්තපටිබද්ධා. තස්මා සඤ්ඤා ච වෙදනා ච චිත්තසඞ්ඛාරොති.

15. කථං ච පනාය්‍යෙ සඤ්ඤාවෙදයිතනිරොධසමාපත්ති හොතීති?

න ඛො ආවුසො විසාඛ සඤ්ඤාවෙදයිතනිරොධං සමාපජ්ජන්තස්ස භික්ඛුනො එවං හොති: අහං සඤ්ඤාවෙදයිතනිරොධං සමාපජ්ජිස්සන්ති වා, අහං සඤ්ඤාවෙදයිතනිරොධං සමාපජ්ජාමීති වා, අහං සඤ්ඤාවෙදයිතනිරොධං සමාපන්නොති වා. අථ ඛ්වාස්ස පුබ්බෙව තථා චිත්තං භාවිතං හොති යන්තං තථත්තාය උපනෙතීති

16. සඤ්ඤාවෙදයිතනිරොධං සමාපජ්ජන්තස්ස පනාය්‍යෙ භික්ඛුනො කතමෙ ධම්මා පඨමං නිරුජ්ඣන්ති: යදි වා කායසඞ්ඛාරො යදි වා වචීසඞ්ඛාරො යදි වා චිත්තසඞ්ඛාරොති?

සඤ්ඤාවෙදයිත නිරොධං සමාපජ්ජන්තස්ස ඛො ආවුසො විසාඛ භික්ඛුනො පඨමං නිරුජ්ඣති වචීසඞ්ඛාරො, තතො කායසඞ්ඛාරො, තතො චිත්තසඞ්ඛාරොති.

17. කථං පනාය්‍යෙ සඤ්ඤාවෙදයිතනිරොධසමාපත්තියා වුට්ඨානං හොති?

න ඛො ආවුසො විසාඛ, සඤ්ඤාවෙදයිතනිරොධසමාපත්තියා වුට්ඨහන්තස්ස භික්ඛුනො එවං හොති: අහං සඤ්ඤාවෙදයිතනිරොධසමාපත්තියා වුට්ඨහිස්සන්ති වා, අහං සඤ්ඤාවෙදයිත නිරොධසමාපත්තියා වුට්ඨහාමීති වා, අහං සඤ්ඤාවෙදයිතනිරොධසමාපත්තියා වුට්ඨිතොති වා. අථ ඛ්වාස්ස පුබ්බෙව තථා චිත්තං භාවිතං හොති යන්තං තථත්තාය උපනෙතීති.

14. ආයුෂ්මෙනි, කවරහෙයෙකින් ආශ්වාසප්‍රශ්වාස කායසංස්කාර වේද? කවරහෙයෙකින් විතර්කවිචාර වාක්සංස්කාර වේද? කවරහෙයෙකින් සංඥා වෙදනා චිත්තසංස්කාර වේද?

ඇවැත විසාඛයෙනි, ආශ්වාසප්‍රශ්වාසයෝ කායික වෙති. මේ ධර්මයෝ කාය ප්‍රතිබද්ධයහ. එයින් ආශ්වාස ප්‍රශ්වාසයෝ කායසංස්කාර වෙති. ඇවැත විසාඛයෙනි, කැලැම විතර්ක කොට විචාර කොට පසු ව බස බිඳුනේ ය. එයින් විතර්කවිචාරයෝ වාක්සංස්කාර වෙති. සංඥා ද වෙදනා ද චෛතසිකයහ. මේ ධර්මයෝ චිත්තප්‍රතිබද්ධයහ. එයින් සංඥා ද වෙදනා ද චිත්ත සංස්කාර වෙති.

15. ආයුෂ්මෙනි, කෙසෙයින් සංඥාවෙදයිත නිරොධ සමාපත්ති වේද?

ඇවැත විසාඛයෙනි, සංඥාවෙදයිතනිරොධසමවතට සමවදනා මහණහට මෙවන් සිත් නොවෙයි: “මම සංඥාවෙදයිත නිරොධයට (මතු) සමවදින්නෙම් කියා හෝ, (දැන්) සමවදිමි කියා හෝ, (අනෙනානිරොධ විසින්) සමවැදිණිමි කියා හෝ”යි. වැලිදු, යම් භාවිත චිත්තයෙක් ඒ මහණ (අනෙනානිරොධ විසින් අචිත්තකභාව සඞ්ඛ්‍යාත) තථාත්වයට එළවා ද, ඒ මහණහුගේ කාලය පිරිසිඳුනා සිත (නිරොධසමාපත්තියෙන්) පළමු කොට ම එසෙයින් භාවිත වෙයි.

16. ආයුෂ්මෙනි, සංඥාවෙදයිතනිරොධසමවතට සමවදනා මහණහට කිනම් ධර්මකෙනෙක් පළමු ව නිරුද්ධ වෙද් ද, කායසංස්කාර හෝ නිරුද්ධ වේද? වාක්සංස්කාර හෝ නිරුද්ධ වේද? චිත්තසංස්කාර හෝ නිරුද්ධ වේද?

ඇවැත විසාඛයෙනි, සංඥාවෙදයිතනිරොධයට සමවදනා මහණහට පළමු ව වාක්සංස්කාර නිරුද්ධ වෙයි. ඉන් පසු කායසංස්කාර නිරුද්ධ වෙයි. ඉන්පසු චිත්තසංස්කාර නිරුද්ධ වෙයි.

17. ආයුෂ්මෙනි, සංඥාවෙදයිතනිරොධසමවතින් නැගී සිටීම කෙසේ වේද?

ඇවැත විසාඛයෙනි, සංඥාවෙදයිත නිරොධසමවතින් නැගෙන මහණහට මෙබඳු සිත් නොවෙයි: “මම සංඥාවෙදයිතනිරොධසමවතින් නැගෙන්නෙම් කියා හෝ, නැගෙමි කියා හෝ, නැගුණෙමි කියා හෝ”යි. ‘වැලිදු, යම් භාවිත චිත්තයෙක් ඒ මහණ (අචිත්තකභාව සඞ්ඛ්‍යාත) තථාත්වයට ගෙන යේද, ඒ මහණහුගේ (අද්ධානපරිච්ඡෙද) චිත්තය කැලැම (අද්ධාන පරිච්ඡෙදකාලයෙහි ම) එසෙයින් භාවිත වෙයි.

18. සඤ්ඤාවෙදයිතනිරොධසමාපත්තියා වුට්ඨහන්තස්ස පනාය්‍යෙ භික්ඛුනො කතමෙ ධම්මා පඨමං උප්පජ්ජන්ති, යදි වා කායසඞ්ඛාරො, යදි වා වචීසඞ්ඛාරො, යදි වා චිත්තසඞ්ඛාරොති?

සඤ්ඤාවෙදයිතනිරොධසමාපත්තියා වුට්ඨහන්තස්ස ඛො ආවුසො විසාඛ භික්ඛුනො පඨමං උප්පජ්ජති චිත්තසඞ්ඛාරො, තතො කායසඞ්ඛාරො, තතො වචීසඞ්ඛාරොති.

19. සඤ්ඤාවෙදයිතනිරොධසමාපත්තියා වුට්ඨිතං පනාය්‍යෙ භික්ඛුං කති ඵස්සා ඵුසන්තීති?.

සඤ්ඤාවෙදයිතනිරොධසමාපත්තියා වුට්ඨිතං ඛො ආවුසො විසාඛ භික්ඛුං තයො ඵස්සා ඵුසන්ති: සුඤ්ඤතො ඵස්සො, අනිමිත්තො ඵස්සො, අප්පණිහිතො ඵස්සොති.

20. සඤ්ඤාවෙදයිතනිරොධසමාපත්තියා වුට්ඨිතස්ස පනාය්‍යෙ භික්ඛුනො කින්නින්නං චිත්තං හොති කිම්පොණං කිම්පබ්භාරන්ති?

සඤ්ඤාවෙදයිතනිරොධසමාපත්තියා වුට්ඨිතස්ස ඛො ආවුසො විසාඛ භික්ඛුනො විවෙකනින්නං චිත්තං හොති විවෙකපොණං විවෙකපබ්භාරන්ති.

21. කති පනාය්‍යෙ වෙදනාති?

තිස්සො ඛො ඉමා ආවුසො විසාඛ වෙදනා: සුඛා වෙදනා, දුක්ඛා වෙදනා, අදුක්ඛමසුඛා වෙදනාති.

22. කතමා පනාය්‍යෙ සුඛා වෙදනා, කතමා දුක්ඛා වෙදනා, කතමා අදුක්ඛමසුඛා වෙදනාති?.

යං ඛො ආවුසො විසාඛ කායිකං වා චෙතසිකං වා සුඛං සාතං වෙදයිතං, අයං සුඛා වෙදනා. යං ඛො ආවුසො විසාඛ කායිකං වා චෙතසිකං වා දුක්ඛං අසාතං වෙදයිතං, අයං දුක්ඛා වෙදනා. යං ඛො ආවුසො විසාඛ කායිකං වා චෙතසිකං වා නෙවසාතං නාසාතං වෙදයිතං, අයං අදුක්ඛමසුඛා වෙදනාති.

23. සුඛා පනාය්‍යෙ වෙදනා කිංසුඛා, කිංදුක්ඛා? දුක්ඛා වෙදනා කිංදුක්ඛා කිංසුඛා? අදුක්ඛමසුඛා වෙදනා කිංසුඛා කිංදුක්ඛාති?.

18. ආයුෂ්මතෙනි, සංඥාවෙදයිතනිරොධ සමවතින් නැගෙන මහණ-හට කිනම් ධර්ම කෙනෙක් පළමු ව උපදනාහු ද, කායසංස්කාර හෝ උපදනේ වේද? වාක්සංස්කාර හෝ උපදනේ වේ ද? චිත්තසංස්කාර හෝ උපදනේ වේ ද?

ඇවැත විසාඛයෙනි, සංඥාවෙදයිත නිරොධසමවතින් නැගෙන මහණ හට පළමු ව චිත්තසංස්කාර උපදනේය. ඉන්පසු කායසංස්කාර උපද-නේය. ඉන්පසු වාක්සංස්කාර උපදනේය.

19. ආයුෂ්මතෙනි, කෙතෙක් ස්පර්ශයෝ සංඥාවෙදයිත නිරොධසමවතින් නැගි මහණ පැහැස ගනිද්ද?

ඇවැත විසාඛයෙනි, ස්පර්ශයෝ තුන් දෙනෙක් සංඥාවෙදයිතනිරොධ-සමවතින් නැගි මහණ පැහැස ගනිති: ශූන්‍යතා පහස, අනිමිත්ත පහස, අප්පණිහිත පහසයි.

20. ආයුෂ්මතෙනි, සංඥාවෙදයිතනිරොධසමවතින් නැගි මහණහුගේ සිත කිමෙක අවනත ව ඇද්ද? කිමෙක ප්‍රවණව (නැමී) ඇද්ද? කිමෙක ප්‍රාග්භාර ව (නැඹුරු) ව ඇද්ද? ඇවැත විසාඛයෙනි, සංඥාවෙදයිත නිරොධ-සමවතින් නැගි මහණහුගේ සිත උපධිවිවෙකය (නිවන) කෙරෙහි අවනතව ඇත. උපධි විවෙකය කෙරෙහි ප්‍රවණ ව සිටියේ වෙයි. උපධිවිවෙකය කරෙහි (හෙත්තාක් සෙයින්) ප්‍රාග්භාරව සිටියේ වෙයි.

21. ආයුෂ්මතෙනි, වෙදනාවෝ කෙතෙක් ඇද්ද? ඇවැත විසාඛයෙනි, මේ වෙදනාවෝ තුන්දෙනෙකි: සුඛවෙදනාය, දුඃඛවෙදනාය, අදුඃඛාසුඛ-වෙදනායි.

22. ආයුෂ්මතෙනි, සුඛවෙදනා කවර? දුඃඛවෙදනා කවර? අදුඃඛාසුඛ වෙදනා කවර?

ඇවැත විසාඛයෙනි, (පඤ්චද්වාරික විසින්) කායික වූ (මනොද්වාරික) විසින් මිහිරි සැහැවි ඇති යම් සුඛවෙදනායෙක් ඇද්ද, මේ සුඛ සහගිය වෙදනා වෙයි. ඇවැත විසාඛයෙනි, කායික වේවයි, චෛතසික වේවයි, නොමිහිරි සැහැවි ඇති යම් දුක්ඛවෙදනායෙක් ඇද්ද, මේ දුක්වෙදනා වෙයි. ඇවැත විසාඛයෙනි, කායික වේවයි, චෛතසික වේවයි, මධුරත් අමධුරත් නො වූ යම් වෙදනායෙක් ඇද්ද, මේ අදුඃඛාසුඛ වෙදනායි කියු.

23. ආයුෂ්මතෙනි, සුඛවෙදනා කුමක් සුඛ කොට ඇති වේ ද, කුමක් දුක් කොට ඇති වේ ද? දුඃඛවෙදනා කුමක් දුක් කොට ඇති වේ ද, කුමක් සුඛ කොට ඇති වේ ද? උපෙක්ෂාවෙදනා කුමක් සුඛ කොට ඇති වේද, කුමක් දුක් කොට ඇති වේ ද?

සුඛා ඛො ආවුසො විසාඛ වෙදනා ඨිතිසුඛා විපරිණාමදුක්ඛා, දුක්ඛා වෙදනා ඨිතිදුක්ඛා විපරිණාමසුඛා, අදුක්ඛමසුඛා වෙදනා ඤාණසුඛා අඤ්ඤාණදුක්ඛාති.

24. සුඛාය පනය්‍යෙ වෙදනාය කිං අනුසයො අනුසෙති? දුක්ඛාය වෙදනාය කිං අනුසයො අනුසෙති? අදුක්ඛමසුඛාය වෙදනාය කිං අනුසයො අනුසෙතීති?

සුඛාය ඛො ආවුසො විසාඛ වෙදනාය රාගානුසයො අනුසෙති. දුක්ඛාය වෙදනාය පටිඝානුසයො අනුසෙති. අදුක්ඛමසුඛාය වෙදනාය අවිජ්ජානුසයො අනුසෙතීති.

25. සබ්බාය නු ඛො අය්‍යෙ සුඛාය වෙදනාය රාගානුසයො අනුසෙති? සබ්බාය දුක්ඛාය වෙදනාය පටිඝානුසයො අනුසෙති? සබ්බාය අදුක්ඛම සුඛාය වෙදනාය අවිජ්ජානුසයො අනුසෙතීති?

න ඛො ආවුසො විසාඛ සබ්බාය සුඛාය වෙදනාය රාගානුසයො අනුසෙති. න සබ්බාය දුක්ඛාය වෙදනාය පටිඝානුසයො අනුසෙති. න සබ්බාය අදුක්ඛමසුඛාය වෙදනාය අවිජ්ජානුසයො අනුසෙතීති.

26. සුඛාය පනය්‍යෙ වෙදනාය කිං පහාතබ්බං? දුක්ඛාය වෙදනාය කිං පහාතබ්බං? අදුක්ඛමසුඛාය වෙදනාය කිං පහාතබ්බන්ති?

සුඛාය ඛො ආවුසො විසාඛ වෙදනාය රාගානුසයො පහාතබ්බො. දුක්ඛාය වෙදනාය පටිඝානුසයො පහාතබ්බො. අදුක්ඛමසුඛාය වෙදනාය අවිජ්ජානු-සයො පහාතබ්බොති.

27. සබ්බාය නු ඛො අය්‍යෙ සුඛාය වෙදනාය රාගානුසයො පහාතබ්බො? සබ්බාය දුක්ඛාය වෙදනාය පටිඝානුසයො පහාතබ්බො? සබ්බාය අදුක්ඛම-සුඛාය වෙදනාය අවිජ්ජානුසයො පහාතබ්බොති?

න ඛො ආවුසො විසාඛ සබ්බාය සුඛාය වෙදනාය රාගානුසයො පහාතබ්බො. න සබ්බාය දුක්ඛාය වෙදනාය පටිඝානුසයො පහාතබ්බො. න සබ්බාය අදුක්ඛමසුඛාය වෙදනාය අවිජ්ජානුසයො පහාතබ්බො.

ඇවැත විසාඛයෙනි, සුඛවේදනා පවතී (අපවතීභාවයෙහි) සුඛ වෙයි. විපරිණාම (නාපවතීභාවයෙහි) දුඃඛ වෙයි. දුඃඛවේදනා පවතී දුඃඛ වෙයි. විපරිණාම සුඛ වෙයි. උපෙක්ෂාවේදනා ඥාන සුඛ (දන්නාබව සුව කොට ඇති) වෙයි. අඥාන දුඃඛ (නොදන්නාබව දුක්කොට ඇති) වෙයි.

24. ආයුෂ්මතෙනි, සුඛවේදනායෙහි කිනම් අනුශය දහමෙක් (නොපුහුන් බැවින් සතන්හි) හෝනේ වේ ද? දුඃඛ වේදනායෙහි කිනම් අනුශය දහමෙක් (සතන්හි) ලගනේ වේ ද? උපෙක්ෂාවේදනායෙහි කිනම් අනුශය දහමෙක් ලුහුබැඳ ලැගගන්නේ වේ ද?

ඇවැත විසාඛයෙනි, සුඛවේදනායෙහි රාගානුශය අනුශයන කෙරෙයි. දුඃඛවේදනායෙහි ප්‍රතිඝානුශය හෝනේ වෙයි. උපෙක්ෂාවේදනායෙහි අවිද්‍යානුශය හෝනේ වෙයි.

25. ආයුෂ්මතෙනි, හැම සුඛවේදනායෙහි රාගානුශය ලුහුබැඳගෙන ලගනේ වේ ද? හැම දුඃඛවේදනායෙහි ප්‍රතිඝානුශය ලුහුබැඳගෙන ලගනේ වේ ද? හැම උපෙක්ෂාවේදනායෙහි අවිද්‍යානුශය ලුහුබැඳගෙන ලගනේ වේ ද?

ඇවැත විසාඛයෙනි, හැම සුඛවේදනායෙහි රාගානුශය නො ලගනේය. හැම දුඃඛවේදනායෙහි ප්‍රතිඝානුශය නො ලගනේය. හැම උපෙක්ෂා වේදනා-යෙහි අවිද්‍යානුශය නො ලගනේය.

26. ආයුෂ්මතෙනි, සුඛවේදනායෙහි කිමෙක් ප්‍රහාතව්‍ය වේ ද? දුඃඛ-වේදනායෙහි කිමෙක් ප්‍රහාතව්‍ය වේ ද? උපෙක්ෂා වේදනායෙහි කිමෙක් ප්‍රහාතව්‍ය වේ ද?

ඇවත විසාඛයෙනි, සුඛවේදනායෙහි රාගානුශය ප්‍රහාතව්‍ය වේ. දුඃඛවේදනායෙහි ප්‍රතිඝානුශය ප්‍රහාතව්‍ය වේ. උපෙක්ෂා වේදනායෙහි අවිද්‍යානුශය ප්‍රහාතව්‍ය වේ.

27. ආයුෂ්මතෙනි, හැම සුඛවේදනායෙහි රාගානුශය ප්‍රහාතව්‍ය වේ ද? හැම දුඃඛවේදනායෙහි ප්‍රතිඝානුශය ප්‍රහාතව්‍ය වේ ද? හැම උපෙක්ෂාවේදනා-යෙහි අවිද්‍යානුශය ප්‍රහාතව්‍ය වේ ද?

ඇවැත විසාඛයෙනි, හැම සුඛවේදනායෙහි රාගානුශය ප්‍රහාතව්‍ය නො වේ. හැම දුඃඛවේදනායෙහි ප්‍රතිඝානුශය ප්‍රහාතව්‍ය නො වේ. හැම උපෙක්ෂාවේදනායෙහි අවිද්‍යානුශය ප්‍රහාතව්‍ය නො වේ.